කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010

2012 අප්‍රේල්/මැයි/ජූනි

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - DMAT E3025

## නාට්‍ය නිර්මාණය හා විචාරය

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි. කාලය : පැය 03 යි.

---

01. නාට්‍ය පිටපතක් රචනා කිරීමේ දී ඔබ විසින් සැලකිල්ලට ගන්නා මූලික සිද්ධාන්ත මොනවා දැයි පැහැදිලි කරන්න.

02. නාට්‍ය රචකයා වචනයෙන් මවන දේ වේදිකාව මත ජීවමාන කරන්නේ නළු නිළියන් විසිනි. සාකච්ඡා කරන්න.

03. නාට්‍ය පිටපත එකක් ම වුවද, අධ්‍යක්ෂවරයා හා නළුනිළියන් වෙනස්වන විට එම පිටපතෙන් බිහිවන නාට්‍ය නිර්මාණයේ ස්වරූපය හා අර්ථකථනය ද වෙනස් වේ. එසේ වීමට හේතු පැහැදිලි කරන්න.

04. වේදිකා නාට්‍ය අංග රචනයේ දී සැලකිල්ලට ගත යුතු කාරණා පිළිබඳ විමසීමක් කරන්න.

05. නළුවාගේ පෞරුෂය හා බාහිර සමාරෝපය ඉස්මතු කිරීම සඳහා වෙස් මෝස්තර හා රංග වස්ත්‍රාභරණ ඉවහල් වන ආකාරය නිදසුන් මගින් පැහැදිලි කරන්න.

06. රූපණය යනු කුමක් දැයි හඳුන්වා දී නළු කාර්යයට ඉවහල් වන විවිධ රූපණ ශෛලීන් පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. රංගාලෝකය සඳහා භාවිත කෙරෙන මූලික පහන් වර්ග හා උපකරණ නම් කොට, ඒවා නාට්‍යයකට නිර්මාණාත්මකව යොදා ගන්නා ආකාරය ඔබ දන්නා උදාහරණ ඇසුරෙන් පෙන්වා දෙන්න.

08. කලාත්මක තෘප්තිය යනු කුමක් දැයි පැහැදිලි කොට නාට්‍ය නැරඹීමේ දී විවිධ පුද්ගලයන් තුළ ජනිත විය හැකි අනෙකුත් තෘප්තීන් කවරේ දැයි පෙන්වා දෙන්න.

09. තේමාව, ශෛලිය, චරිත නිරූපණය හා ආනුෂංගික අංශ ගැන අවධානය යොමු කරමින් ඔබ මෑතක දී නැරඹූ සාර්ථක නාට්‍යයක් පිළිබඳ විචාරයක් ලියන්න.

********************************